# සමන්තපාසාදිකාව (බාහිර නිදානවණ්ණනාව) ඓතිහාසික මූලාශ්‍රයක් වශයෙන් ඇති වැදගත්කම විමර්ශනය කිරීම

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

*අයි. ඩී. මධුෂානි ලසන්තිකා වික්‍රමරත්න* [1]
*ඒ.එච්.එම්.එච් අභයරත්න* [2]

සංක්ෂේපය

ඉතිහාසය හැදෑරීමේ දී වැදගත් වන ඓතිහාසික මූලාශ්‍රය රාශියක් දැකිය හැකි ය. නමුත් මෙම මූලාශ්‍රය ඇසුරින් හඳුනා ගත හැකි ඓතිහාසික තොරතුරු පිළිබඳව යොමු කර ඇති අවධානය පිළිබඳව සෑහීමකට පත්වීම අපහසු ය. ලංකාවේ මේ වන විට ඉතිහාසඥයන් මහාවංසය හා දීපවංසය ප්‍රධානතම ප්‍රාථමික මූලාශ්‍රය ලෙස භාවිත කරනු ලබයි. නමුත් අප සතුව ඇති මූලාශ්‍රය දෙස බැලීමේදී ඉතිහාසය රචනා කිරීමම අරමුණ නොවුණ ද තත් සමයන්හි වැදගත් වූ තොරතුරු ද මෙම මූලාශ්‍රය මඟින් හඳුනා ගත හැකි ය. ඒ අනුව පර්යේෂණයට පාදක කරගන්නා සමන්තපාසාදිකාව බුද්ධඝෝෂ තෙරුන් විසින් රචනා කරන ලද විනය අට්ඨකථාවයි. විනය සඳහා රචනා කරන ලද එකම අට්ඨකථාව වන මෙම සමන්තපාසාදිකාව බාහිර නිදාන වණ්ණනාවෙහි ඓතිහාසික වැදගත්කම විමර්ශනය කිරීම ඉතා වැදගත් ය. බුද්ධඝෝෂ අටුවාචාරීන් විසින් මෙම විනය අටුවාව රචනා කරනු ලැබ ඇත්තේ මහාවිහාර සම්ප්‍රදාය ගරු කරමින් ලංකාවේ පැවති හෙළ අටුවා පාලියට නඟමින් ධර්මය ආරක්‍ෂා කොට තැබීම මූලික පරමාර්ථය කර ගනිමින් වුව ද පර්යේෂණය සඳහා යොදා ගනු ලබන බාහිර නිදාන වණ්ණනාව තුළින් ඓතිහාසික තොරතුරු සමූහයක් උකහා ගත හැකි ය. ඒ අනුව ශාසන ඉතිහාසය, භාරතීය දේශපාලන හා සමාජීය තොරතුරු ද, ලංකාවේ ආගමික තත්ත්වය හා ලංකාවේ දේශපාලන සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳව ද හඳුනා ගත හැකි ය. සමන්තපාසාදිකා විනය අටුවාවේ බාහිර නිදාන වණ්ණනාව ඓතිහාසික වශයෙන් ඇති වැදගත්කම විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ අභිමතාර්ථයයි. ධර්ම ග්‍රන්ථයක් වුව ද ඓතිහාසික වශයෙන් සමන්තපාසාදිකාවේ ඇති වැදගත්කම, ඉතිහාසය හැදෑරීමේ ප්‍රාථමික මූලාශ්‍රයක් ලෙස යොදා ගැනීමේ ශක්‍යතාව හඳුනා ගැනීම මෙහි දී සිදු විය. මෙම පර්යේෂණය සිදු කිරීම සඳහා ප්‍රාථමික හා ද්විතික මූලාශ්‍ර උපායෝගී කර ගැනුනි. සමන්තපාසාදිකාවේ ඓතිහාසික වැදගත්තම විමර්ශනය කිරීම සඳහා මූලික වශයෙන් එහි බාහිර නිදාන වණ්ණනාව, මහාවංසය දීපවංසය යන මූලාශ්‍රය යොදා ගැණුනි. මීට අමතරව වංසත්තප්පකාසනිය, බෝධිවංසය, සුමංගලවිලාසිනිය, ධාතුවංසය, සමන්තකූට වණ්ණනාව වැනි ප්‍රාථමික මූලාශ්‍රය ද යොදා ගනු ලැබේ. ඊට අමතරව මූලාශ්‍රයවලින් හෙළි කරන තොරතුරු සනාථ කර ගැනීම සඳහා ප්‍රස්තුත කාලයට අයත් පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ද භාවිත කිරීම අපේක්‍ෂාවයි. මේ අනුව සමන්තපාසාදිකාව අධ්‍යයනයේ දී නිගමනය කළ හැක්කේ සමන්තපාසාදිකාවේ බාහිර නිදාන වණ්ණනාව ඉතිහාසය හදාරන ශිෂ්‍යයකුට ප්‍රධාන වශයෙන් ශාසන ඉතිහාසය භාරතීය ඉතිහාසය හා ලංකාවේ ඉතිහාසය ගොඩනැගීමේ දී අනල්ප පිටුබලයක් ලබා දෙන අතර ම මූලාශ්‍රමය ගුණය අතින් එම බාහිර නිදානවණ්ණාව අතිශයින් වැදගත් වන බවයි. මෙලෙස සමන්තපාසාදිකාව  විමර්ශනය කිරීමේ දී එහි බාහිර නිදාන වණ්නනාව ඓතිහාසික වශයෙන් වැදගත් වන බව පැහැදිලි ය.

මුඛ්‍ය පද - දේශපාලනය, සමාජය, ශාසනය, සමන්තපාසාදිකාව, මහාවංසය

1 *ඉතිහාසය, ඉතිහාසය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව;* madushani6772@gmail.com
2 *මහාචාර්ය, ඉතිහාසය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*